# කුරුළු පවුල



සෙනුජ් යශස්වි රණසිංහ

කෘතියේ නම - කුරුළු පවුල

කතෘ - සෙනුපී යශස්වි රණසිංහ

කතාව සහ චිත්‍ර - සෙනුපී යශස්වි රණසිංහ

පන්තිය - 4 ශ්‍රේණිය

පාසල - මහාමායා බාලිකා විදුහල

කතෘගේ වෙනත් කෘති - මගේ පුංචි වසුපැටියා

ISBN - 978-624-208-072-7

# පිදුම

මාගේ අත්තම්මා,

අම්මා සහ තාත්තාට ද,

ගුරු මෑණිවරුන්ටද,

ආදරයෙන්

මෙම පොත පිළිගන්වමි

# ස්තූතියි

## පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකූර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.


2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.


මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023-10-20

එක ගමක් අද්දර කැළෑවක කුරුළු අම්මයි  කුරුළු තාත්තයි දෙන්නෙක් හිටියා. මේ දෙන්නා ලස්සන කුරුළු කූඩුවක් හැදුවා. එක දවසක් කුරුළු අම්මා බිත්තරයක් දැම්මා. කුරුළු අම්මයි තාත්තයි මේ බිත්තරය ආදරයෙන් රැක බලා ගත්තා.



පුංචිම පුංචි කුරුළු පැටියෙක් දින කීපයකින් කිච්බිච් ගෑවා. දැන් මේ කුරුළු අම්මටයි තාත්තටයි හරිම සතුටුයි. කුරුළු අම්මා පුංචි පුතාව තටුවක් අස්සේ තියාගෙන නලවනවා. කුරුළු තාත්තා පුංචි කුරුළු පුතාට කෑම ගෙනල්ලා කවනවා.



කුරුළු අම්මා පුංචි පැටියාව වැස්සෙන්, පින්නෙන් හොඳට ආරක්ෂා කරනවා. ඒවගේම වටපිට නපුරු සතුන් ගැනත් විමසිල්ලෙන් තමයි ඉන්නේ. දැන් අම්මා තාත්තාගේ ආරක්ෂාවත්, කෑම බීමත් නිසා පුංචි පැටියා ටික ටික ලොකු වෙනවා.



එක දවසක් කුරුළු තාත්තා වටපිට බලද්දි දැක්කා ලොකු ගැරඬියෙක් කූඩුව තියෙන ගස දිගේම උඩට බඩ ගානවා. කුරුළු තාත්තා හොඳටම බය වුණා. එයා කිරිල්ලිට ඇහෙන්න හයියෙන් ''කිච්බිච්'' ''කිච් බිච්'' කියලා කෑ ගහනවා. එහාට පියැඹුවා. මෙහාට පියාඹුවා.



කූඩුව වටේටම ඉගිල්ලුනා. අත්තේ වාඩිවෙලා ''අනේ මට කවුරුත් උදව් කරන්න කියලා'' කෑ ගැහුවා. කුරුළු අම්මත් හොඳටම බයවෙලා කුරුළු පුතාව බදාගෙන ''කිච්බිච්'' කියලා අඬනවා. මේ කුරුල්ලන්ගේ කෑ ගහන සද්දේ ළඟ ගෙදරක පුංචි දුවෙකුට ඇහුණා. එයා එළියට ඇවිල්ලා වටපිට බැලුවා. කොහේද කුරුල්ලෝ කෑ ගහන සද්දයක් ඇහෙන්නේ කියලා බැලුවා ''ආ අර ගහ උඩින්මයි ඒ සද්දේ එන්නේ'' එතකොටම එයා දැක්කා ගහ දිගේ උඩට ගැරඬියෙක් බඩ ගානවා. ඒ පුංචි දුව හයියෙන් කෑ ගැහුවා.

''අයියේ ! අයියේ ! ඉක්මනින් එන්න

ගැරඩියෙක් කුරුළු කූඩුවට යන්නයි හදන්නේ අනේ.... පව් කුරුළු පැටියා බේරගන්න.''



අයියා ඉක්මනින් දුවගෙන ආවා.

''ඉන්න නංගි මම දිග ලීයක් ගේන්නම්''

අයියා දිග ලීයක් අරගෙන ආවා ''නංගි ඔයා ඈතට යන්න'' අයියා කිව්වා.

''මම ගැරඩියාව ඈතට විසිකරන්නම්.''



අයියා ගැරඬියාව ඈතට විසිකලා. උග්‍ර වේගයෙන් කැලේ අස්සට රිංග ගත්තා. නංගිටයි අයියටයි හරි සතුටුයි.

කුරුළු අම්මයි තාත්තයි සතුටින් කෑ ගැහුවා. කුරුළු පුතාව ආරක්ෂා කලාට ස්තූති කරන්න වගේම නංගිගෙයි අයියාගෙයි වටේට පියාඹුවා.

## නිමි.



## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචානා කරන්නට විය. ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකූර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ
2023-10-20